## මැතිවරණ දින ප්‍රකාශය - පාර්ලිමේන්තු මහ මැතිවරණය (2015 අගෝස්තු 17)

## පැෆ්රල් සංවිධානය

අද දින පැවති මහ මැතිවරණය මෙරට මැතිවරණ ඉතිහාසයේ මෙතෙක් පැවති ඉතාම සාමකාමී හා සාධාරණ මැතිවරණයක් ලෙස සැලකිය හැකිය. රජය, දේශපාලන පක්ෂ/ කණ්ඩායම් සහ එකී පක්ෂවල ආධාරකරුවන් මැතිවරණ කොමසාරිස්වරයා විසින් පනවන ලද නීති රීති ආදියට සැලකිය යුතු මට්ටමකින් අනුකූලව කටයුතු කිරීම විශේෂ කරුණක් විය. මෙම තත්ත්වය මඟින් පැහැදිලි වන්නේ සිය බලතල නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා හට යහපත් වතාවරණයක් පැවති බවයි.

2015 ජනවාරි පැවති ජනාධිපතිවරණයේදී රාජ්‍ය දේපළ සහ සම්පත් භාවිතය ඉතා විශාල වශයෙන් දක්නට ලැබුණද මෙම මැතිවරණයේදී එම තත්ත්වය අවම මට්ටමක පැවති අතර එය පෙර පැවති ජනාධිපතිවරණය හා සන්සන්දනය කිරීමේදී දක්නට ලැබුණු සුවිශේෂී වෙනස්කමකි.

සමස්තයක් වශයෙන් මැතිවරණ දිනය තුළ සිද්ධින් 212ක් වාර්තා වු අතර කිසිදු බරපතල සිදුවීමක් වාර්තා නොවුණි. පූර්ව මැතිවරණ අවධිය තුළ පැෆ්රල් සංවිධානය වෙත සිදුවීම් 1194 ක් වාර්තා වූ අතර ප්‍රචාරණ කටුයුතු සිදු නොකළ යුතුයැයි සැලකුණු අවසාන දින දෙකක කාලය තුළ තවත් සිදුවීම් 129 ක් වාර්තා විය. මේ අනුව මෙවර මැතිවරණ සමය තුළ පැෆ්රල් සංවිධානය වෙත වාර්තාවූ සමස්ත සිදුවීම් සංඛ්‍යාව 1323 කි. මෙකී සමස්ත සිදුවීම් සංඛ්‍යාව අතරින් වඩාත් බරපතල යැයි සැලකිය හැකි සිදුවීම් ලෙස මැතිවරණය ආශ්‍රිතව සිදුවූ පුද්ගල ඝාතනයන් 03 සඳහන් කළ හැක. පූර්ව-මැතිවරණ සමය තුළ පුද්ගලයන් 600 කට අධික ප්‍රමාණයක් අත්අඩංගුවට පත්විය.

ජනාධිපතිවරයා විසින් මැතිවරණ කොමසාරිස්වරයාගේ නිර්දේශ මත පදනම්ව තැපැල් සේවා අමාත්‍යංශයේ ලේකම්වරයා එකී ධූරයෙන් ඉවතකරන්නට කටයුතු කරන ලදි. එහිලා සඳහන් වන ආකාරයට අදාළ ලේකම්වරයා විසින් ස්වකීය අමාත්‍යංශයේ සම්පත් භාවිත කිරීමට අපේක්ෂකයෙකු හට ඉඩ ලබාදීම මෙයට හේතුවී ඇත. ජනාධිපතිවරයා විසින් ගත් මෙම පියවර මැතිවරණ කොමසාරිස්වරයාට, එකී දෙපාර්තමේන්තුවට සහ පොලිස් දෙපාර්තමේන්තුවට ස්වකීය රාජකාරී නිසි ලෙස පවත්වාගෙන යාම සඳහා සලසන ලද ඉමහත් සහයෝගයකි. ජනාධිපතිවරයාගේ ඉහත තීරණය අප ඉතා ඉහළින් අගයකරමු. තවද, ජනාධිපතිතුමන් විසින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජනතා නිදහස් සන්ධානය යන පක්ෂවල මහ ලේකම්වරුන් එකී තනතුරුවලින් ඉවත් කරනු ලැබීම ද අපගේ අවධානයට යොමුවිය යුතුය. මැතිවරණ දිනයට එක් දිනකට පෙර ජනාධිපතිවරයා විසින් ගනු ලැබූ මෙම ක්‍රියාමාර්ගය හේතුවෙන් එම පාක්ෂිකයන් ගැටලුකාරී තත්ත්වයකට මැදි වු බව දක්නට ලැබුණි.

19 වන සංශෝධනය ප්‍රකාරව තමන් වෙත පැවරී ඇති බලතල ක්‍රියාවට නැංවීම සහ සාමකාමී මැතිවරණයක් සහතික කිරීමේ අරමුණින් පනවා ඇති නීතිරීති නිසි පරිදි



# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.
Tel : (+94) 11 2514441 / 11 2514442 Fax : (+94) 11 2514443
E-mail : paffrel@sltnet.lk Website : www.paffrel.lk

ක්‍රියාත්මක කිරීමටත් මැතිවරණ කොමසාරිස්වරයා විසින් මැතිවරණ කාල සීමාව පුරාම කටයුතුකිරීම අප සියලු දෙනාගේම ප්‍රශංසාවට ලක්විය යුතුය. මෙම මැතිවරණයේදී මැතිවරණ කොමසාරිස්වරයා විසින් පනවන ලද නීති සහ උපමාන හේතුවෙන් මැතිවරණ සමයේ සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා සහ අනෙකුත් සියලුම මැතිවරණ නීති උල්ලංඝණය කිරීම් අවම තත්ත්වයක පැවතිණි. එමෙන්ම නිහඬ කාලසීමාව තුළ අපේක්ෂකයන්ගේ මැතිවරණ දැන්වීම් සහිතව මුද්‍රණය කරන ලද රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුවත්පත් ඉවත් කිරීමටද මැතිවරණ කොමසාරිස්වරයා නියෝග කර තිබිණ. මැතිවරණ සමයේ සිදුවන නීති උල්ලංඝණයන් අවම තත්ත්වයක පවත්වාගැනීම සම්බන්ධයෙන් පොලිස්පතිවරයාට අපගේ ගෞරවය හිමිවිය යුතුය. මන්නාරම් දිස්ත්‍රික්කයේ මුසලි ප්‍රදේශයේ සහ මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩි ප්‍රදේශයේ සාමකාමී තත්ත්වය රැකගැනීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් ගත් උත්සාහයන් අති ප්‍රශංසනීයය.

මැතිවරණ ප්‍රචාරණ සමය තුළ පැමිණිලි 1323 ක් පැෆ්රල් සංවිධානයට වාර්තා වුවද, ඉන් බහුතරය බරපතල ප්‍රචණ්ඩ ක්‍රියා ගණයට අයත් නොවන ඒවා වේ. පොලිස් දෙපාර්තමේන්තුව පූර්ව-මැතිවරණ සමය තුළ නීති විරෝධී දැන්වීම් පුවරු සහ පෝස්ටර් ඉවත්කිරීමට අඛණ්ඩව කටයුතු කරන ලදි. තවද, මැතිවරණ නීති උල්ලංඝනය කළ පුද්ගලයන් 600 කට වඩා වැඩි පිරිසක් මෙම සමය තුළ අත්අඩංගුවට ගෙන ඇත. සියලුම දේශපාලන පක්ෂ ඔවුන්ගේ සම්පූර්ණ සහයෝගය මැතිවරණ ක්‍රියාවලිය සඳහා දැක්වීම මෙවර මැතිවරණයේදී දක්නට ලැබුණු සුවිශේෂී තත්ත්වයකි.

පැෆ්රල් සංවිධානය විසින් දිවයින පුරා පැවැති සියලුම ඡන්ද මධ්‍යස්ථාන වලට ස්ථානගත නිරීක්ෂකයින් 12,314 ක් යෙදවීමට කටයුතු කරන ලදි. හඳුනාගත් අවධානම් ප්‍රදේශවලට විශේෂ මැතිවරණ නිරීක්ෂණ රථ 25 ක් යොදවන ලදි. තවද, විශේෂඥ සුදුසකම් ඇති මැතිවරණ නිරීක්ෂකයන් හතර දෙනෙකුගෙන් සමන්විත ජංගම නිරීක්ෂණ රථ 335 ක් දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණයවන පරිදි යොදවන ලදි. පැෆ්රල් සහ ඇන්ෆ්‍රල් වැනි සංවිධාන හරහා අන්තර්ජාතිකව විෂය ප්‍රවීනත්වය ලැබූ, ආසියාතික රටවල් නියෝජනය කරමින් පැමිණි විදේශීය මැතිවරණ නිරීක්ෂකයන් 14 ක් ද කාර්යයේ යොදවන ලදි. මැතිවරණය පවත්වා අවසන් කළ අද දිනයේ සිට සති දෙකක් ඉදිරියට පශ්චාත් මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මකවනු ඇත.

සිවිල් සමාජය අන් කිසිඳු මැතිවරණයකදී පෙන්නුම් නොකළ උනන්දුවක් ද සහිතව මෙවර මැතිවරණය හා සම්බන්ධිත නිරීක්ෂන කණ්ඩායම් සූදානම් කිරීමේත් නිදහස් හා සාධාරණ මැතිවරණයක් උදෙසා ජනතාව දැනුවත්කිරීමේත් නිරතවිය. සියලුම අපේක්ෂකයන් පිරිසිඳු සහ අවංක අයවලුන් වියයුතු බවත් ඡන්දදායකයන් ඡන්දය භාවිත කළ යුත්තේද එවැනිම පිරිසකට බවත් මාර්තු 12 ව්‍යාපාරය මගින් සියලුම දේශපාලන පක්ෂවලට නිරන්තරයෙන් සිහිපත් කරන ලදි.

දේශපාලන ප්‍රචාරණ කටයුතු සම්බන්ධව අපේක්ෂකයන් විසින් වැයකරන මුදල් සඳහා යම් ආකාරයක නිර්ණායකයන් සකස් කරමින් වඩාත් සාධාරණ ප්‍රචාරණ ක්‍රියාවලියක් සඳහා පසුබිම සකස්කිරීමටත්, මැතිවරණ දිනයේදී ඡන්ද මධ්‍යස්ථාන වෙත යා නොහැකි ඡන්දදායකයන්ට සහ ආබාධිත පුද්ගලයන් හට තම ඡන්දය අපහසුවකින් තොරව භාවිත කිරීමට හැකිවන පරිදි ඡන්ද ක්‍රමය වැඩි දියුණුකිරීමටත්, රටින් පිට වෙසෙන ශ්‍රම බලකායේ ඡන්ද අයිතිය තහවුරුකිරීමටත්, දේශපාලන පක්ෂවල කාන්තා නියෝජනය ප්‍රවර්ධනය කිරීමටත් කටයුතු කරන ලෙස පැෆ්රල් සංවිධානය විසින් ඉදිරියේදී රැස්වීමට නියමිත නව පාර්ලිමේන්තුව වෙත අවධාරණය කර සිටී. ඉදිරියේදී පැවැත්වෙන මැතිවරණ වඩාත් නිදහස් හා සාධාරණ

අයුරින් පැවැත්වීමේ අභිලාෂයත් ඒ හරහා රට තුළ වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සංස්කෘතියක් බිහිකරගැනීමේ අවශ්‍යතාවයත් උදෙසා මැතිවරණ කොමසාරිස්වරයා සහ එම දෙපාර්තමේන්තුවත් මෙරට සිවිල් සමාජයත් සහයෝගයෙන් යුතුව කටයුතු කළ යුතු යැයි අප මෙහිලා වැඩිදුරටත් සඳහන් කර සිටිමු.

............................
රෝහණ හෙට්ටිආරච්චි,
විධායක අධ්‍යක්ෂ.